කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක . 28 (II)

මගේ අංකය : DMS/CM/පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2006.08. 01 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම් සභාපතිවරුන් වෙත

## රාජ්‍ය සේවය, පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට <u>අළුතින් බඳවා ගැනීම් අත් හිටුවීම</u>

ඇතැම් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් විධිමත් අනුමැතියකින් තොරව බඳවාගැනීම් සිදු කර ඇති බව අනාවරණය වී ඇත. එබැවින් එලෙස යම් ආයතනයක් විධිමත් අනුමැතියකින් තොරව බඳවාගැනීම් සිදු කර ඇත්නම් ඒ සම්බන්ධව එකී ආයතන ප්‍රධානියා ඊට පෞද්ගලිකවම වගකිව යුතු බවට ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා නියෝග කරන ලදී.

02. රාජ්‍ය සේවය, පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල මාණ්ඩලික නිලධාරී, යටත් නිලධාරී සහ සුළු සේවක තනතුරු සඳහා ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගැනීම් සිදු කිරීම 2006.04.10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 හා 2006.05.26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (1) මගින් ලබාදුන් උපදෙස් පරිදි සිදු කළයුතුය.

03. ඉහත කළමනාකරණ සේවා අංක 28 හා 28 (1) චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් අනිබවා යමින් බඳවා ගැනීම් සිදු නොකළයුතු අතර, එබඳු බඳවා ගැනීමක් සිදු කළහොත් අදාල ආයතන ප්‍රධානියා ඒ සඳහා පෞද්ගලිකවම වගකීමෙන් බැඳී සිටින බව අවධාරණය කරමි.

පී.බී. ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
05. විගණකාධිපති
06. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
07. ලේකම්, මුදල් කොමිෂන් සභාව

C/MD/mancu28